**ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

---

## 01. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 11 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන උසාවි දඩ ලේඛණයට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල රු.1,327,740 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.605,458 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) 2013 වර්ෂයේදී රු.3,452,403 කට මිලදීගෙන තිබෙන PVC ජලනල තොගය අතැති තොග අගයට ඇතුලත් කර නොතිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.169,196 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායමට වැඩි පුනරාවර්තන වියදම රු.2,923,387 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

-------------------------

**2.2.1 බදු කුලි**

---------

(අ) 2014 දෙසැම්බර් 18 දිනැති ටෙන්ඩර් මණ්ඩල තීරණය අනුව 2015 වර්ෂය සඳහා ගලෙන්බිඳුණුවැව සතිපොල රු.2,215,600 ක වාර්ෂික කුලියට ලබාදී තිබුණි. සතිපොල අළුත්වැඩියා කටයුතු හේතුවෙන් බදු කුලියෙන් රු.92,316 ක් කපා හැරීමට අදාලව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) රු.357,150 ක්වූ හිඟ කඩකුලී අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තියෙන් ලේකම්වරයාට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.2.2 මුද්දර ගාස්තු**

----------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල හිඟ මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

--------------------------------------

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ රු.1,748,108 ක්වූ ආදායම් වෙනුවෙන් තැන්පතු ගිණුම විශ්ලේෂණය කිරීමේදී රු.755,550 ක්වූ ශේෂය සම්බන්ධ තැන්පතුකරුවන් පිළිබඳ විස්තර ඉදිරිපත් කිරිමට සභාව අපොහොසත් විය.

(ආ) 2012 වර්ෂයේ දැයට කිරුළ ව්‍යාපෘතියෙන් ගලෙන්බිඳුණුවැව නාගරික ජල සම්පාදනය සඳහා වෙන්කළ රු.මිලියන 05 ක මුදලට සරිලනසේ 2013 වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.3,452,403 ක් වටිනා PVC ජලනල බට තොගය 2016 අප්‍රේල් මාසය වනවිටත් ව්‍යාපෘතියේ ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර තිබුණි.

(ඇ) සභා ගොඩනැගිල්ල පිහිටි භූමියේ අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 කොන්ත්‍රාත් පාලනය**

------------------------

(අ) රු. 141,000 ක් වැයකර මිලදීගත් බවට සඳහන් බොරළු කියුබ් 133 ක් යොදා සංවර්ධනය කරන ලද මාර්ග සහ එම එක් එක් මාර්ගයට අතුරන ලද බොරළු ප්‍රමාණය කොපමණද යනාදී තොරතුරු විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ආ) 2014 වර්ෂයේ සභාව විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘතිවලට අදාල පරිපාලන වියදම් වලින් රු.226,252 ක මුදලක් උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ 2009 අප්‍රේල් 20 දිනැති අංක 2009/9 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයට පටහැනිව කටයුතු කරමින් දීමනා වශයෙන් සභාවේ නිලධාරීන් 10 දෙනෙකුට ගෙවා තිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

-----------------------------

### 3.3.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

--------------------------------

සභාවේ දේපල සම්බන්ධයෙන් 1989 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 203 ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පසුගිය වර්ෂ ගණනාවකට අදාලව සිදුකර නොතිබුණි.

### 3.3.2 නිශ්ක්‍රීය වත්කම්

---------------------

(අ) ජල ව්‍යාපෘතියක් ඉදිකිරීම වෙනුවෙන් 2013 වර්ෂයේදී මිලදී ගෙන තිබෙන රු.3,452,403 ක් පිරිවැය වූ PVC ජලනල තොගයක් සභා භූමියේ නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) සභාව සතු රු.1,572,000 ක්වූ වාහන 02 ක් රු.1,325,000 ක් වූ යන්ත්‍ර 02 ක් හා වටිනාකම සඳහන් නොවූ කැබ් රථයක් සමාලෝචිත වර්ෂය තුල අදාල කාර්යයන්වල යොදා ගැනීමකින් තොරව නිශ්ක්‍රීයව පැවතුණි.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

හුරුළුනිකවැව වසමේ ප්‍රජාශාලාව ඉදිකිරීම හුරුළුනිකවැව බෙදුම් ඇල ගොවි සංවිධානය මගින් සිදුකර රු.956,763 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණු අතර ඉදිකිරීම් 2016 අප්‍රේල් 26 දින භෞතික පරීක්ෂාවේදී කපරාරු ස්ථාන ඉරිතැලී ඇති බවත්, පලංචි ගැහිම මත බිත්තිවල ඇතිවී තිබුණු කවුළු නිසි පරිදි වසා දමා නොමැති බවත්, මුදුන් උළු සෙවිලි කිරීමේදී ඒවා බදාම යොදා කුමේර බැද ස්ථිර තත්ත්වයට පත්කර නොතිබුණු බවත්, කාප්ප සකසා සවි කිරීමේදී ඒවා 16mm රුන් ඇණ යොදා 6 mm පතුල් තහඩු වලට සම්බන්ධ කර නොතිබුණු බවත්, පර්ලින් සකසා 10 mm ඇණ යොදා සවිකිරීම් සිදුකර නොතිබුණු බවත්, මල නිවාරණ තීන්ත නියමිත පරිදි ආලේප කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

## 04. පද්ධති හා පාලනය

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පාලනය